කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව
අනුරාධපුර දිස්ත්‍රික්කය

---

01. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 09 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 10 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය නොකළ මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ඉඩම් සහ ගොඩනැගිලි ඒකක 05 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | සභාවට අයත් දේපල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ලෙජරයේ ගිණුම් 10 ක රු.4,370,044 ක වටිනාකම එදිනට ශේෂ පිරික්සුමේ රු.134,967,037 ක් ලෙස දක්වා තිබීම නිසා රු.135,247,320 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් 03 ක රු.788,132 ක් වූ ආදායම් අදාළ ආදායම් ලේඛන අනුව රු.799,262 ක් වූ බැවින් රු.153,030 ක එකතු වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
-----------------------------------------------------
තොරතුරු ඉදිරිපත් නොකිරීම
-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.132,409,114 ක් වූ ගිණුම් විෂයයන් 12 කට අදාලව පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. | පිළිගනිමි. |

1.3 අනුකූල නොවීම
--------------------
නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.
--------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | | |
| | පළමු පරිච්ඡේදයේ රීති 5.11 | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. | අදාළ රීතිවලට අනුව කටයුතු කළයුතු වේ. | රක්ෂණ ආවරණය ලබාගැනීමට කටයුතු කරමි. |
| (ආ) | මුදල් රෙගුලාසි 1645 සහ 1646 වගන්ති | ධාවනයේ යොදවා තිබුණු සියළු වාහන සහ යන්ත්‍ර සම්බන්ධව 2015 වර්ෂයේ සිට දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ සකස් කර නොතිබුණි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළයුතු වේ. | 2020 වර්ෂයේ සිට වාහන 03 ක් සඳහා දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා සකස් කර ඇත. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන සම්බන්ධව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛයට අනුව කටයුතු කළයුතු වේ. | වාහන 07 ක් සඳහා ඉන්ධන පරීක්ෂාවන් සිදු කර ඇත. ඉතිරි වාහන සඳහා මෙම වර්ෂයේ දී සිදුකිරීමට කටයුතු කරමි. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.688,371 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,649,539 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,050,000 | 935,700 | 935,700 | - | 925,000 | 832,985 | 832,985 | - |
| (ii) | කුලී | 6,161,616 | 4,526,687 | 4,722,723 | 30,100 | 7,715,924 | 8,926,673 | 8,926,673 | 226,136 |
| (iii) | බලපත්‍ර ගාස්තු හා සේවා | 780,000 | 684,220 | 684,220 | - | 2,290,000 | 473,020 | 473,020 | - |
| (iv) | වෙනත් ආදායම් | 24,302,084 | 21,783,500 | 20,412,460 | 2,646,649 | 17,935,943 | 14,148,149 | 14,148,149 | 1,275,609 |
| | | 33,293,700 | 27,930,107 | 26,755,103 | 2,676,749 | 28,866,867 | 24,380,827 | 24,380,827 | 1,501,745 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු පනවා නොතිබුණි. | දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.346,552 ක් හා මුද්දර ගාස්තු රු.1,970,687 ක් විය. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව වූ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2019 දෙසැම්බර් 31 දිනට අදාල කාරණා සම්බන්ධව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළයුතු වේ. | අතුරු ව්‍යවස්ථා පැනවීම සිදුකර ප්‍රාදේශීය සභා පනත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී. |

(ආ) අපේක්ෂිත නිමවුම් මටට්ම (Out Put) ලබානොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු කැබිතිගොල්ලෑව ජල පෙරන මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.559,738 ක මුදලක් වැයකර තිබුණද, ජල පෙරන යන්ත්‍ර සවිකර ප්‍රයෝජනයට ගෙන නොතිබුණු නිසා අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Put) අත්පත් කරගෙන නොතිබුණි. | ජල පෙරන යන්ත්‍ර සවිකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කුලී පදනම මත ලබාදී තිබුණු යන්ත්‍ර 02 ක ගිණුම්ගත කර තිබුණු ආදායම රු.1,014,989 ක් වුවද එම යන්ත්‍ර 02 කුලී පදනම මත මීටර් පැය 580.5 ක් ලබාදී තිබුණු බැවින් අයකල යුතු කුලී ආදායම රු.2,197,542 ක් විය. | සභාවේ සියලුම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර කුලී පදනම මත වාහන/ යන්ත්‍ර ලබාදීමට අදාල හිඟ ආදායම නොපමාව අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී ක්‍රමවත් වැඩ පිළිවෙලක් සිදුකිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 වර්ෂයේ ඉදිකිරීම් නිමකල කැබිතිගොල්ලෑව බස් නැවතුම්පලේ කඩකාමර 46 කින් සමන්විත දෙමහල් වෙළඳ සංකීර්ණය බදුදීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් බදු දීමට හෝ කුලියට දීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.3,938,818 ක් වූ වත්කම් වර්ග 12 ක් වර්ෂ 05 කට වැඩි කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුවේ. | පිළිගනිමි. |
| (ආ) | සභාවට අයත්ව තිබුණු අංකය සොයාගත නොහැකි අබලන්ව තිබුණු ඩබල් කැබ් රථය අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |

04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව සෘජුවම වගකියනු ලබන අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර වාර්තා ලබාගෙන නොතිබුණි. | අභ්‍යන්තර විගණනය යාවත්කාලීනව සිදුකර මූල්‍ය හා පරිපාලන කටයුතු නිවැරදි කරගත යුතු වේ. | පිළිගනිමි. |

4.2 විගණන හා කළමණාකරන කමිටු ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2016 ජනවාරි 28 දිනැති DMA/2009(1)(i) දරන කළමනාකරණ හා විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |